

# ශිෂ්‍යත්ව සාධන මට්ටම් පරීක්ෂණය - 2022

## මිරිගම අධ්‍යාපන කොට්ඨාසය

**4 ශ්‍රේණිය**




deomirigama@gmail.com 0332273562




නම : - ........................................................................ කාලය : පැය 01

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. පළමු රූපයෙන් දැක්වෙන ද්‍රව්‍යයට ආදේශනය කළ හැකි ද්‍රව්‍ය දැක්වෙන රූපය තෝරන්න.

(1) (2) (3)

3.කොටුව තුළ ඇති සංඛ්‍යාවල අගය වෙනුවට ආදේශනය කළ හැකි අගයකින් යුතු සංඛ්‍යා සහිත කොටුව තෝරන්න.

5+ [10+ 2] = 17

i. [2 x 5] ii [4 x 3] iii. [3 x 5]



4. 50 + [20 + 10] = 80

I. [70 ÷ 2]
II. [60 ÷ 2]
III. [40 ÷ 2]

5. ගැමුණු රහස් සංකේත යොදා විනෝදයට වචන ලියයි. ඔහු වටවල යන වචනය රහස් සංකේත යොදා ලියා තිබූ ආකාරය වන්නේ මින් කුමක්ද?

1.  2.  3. 

6. ඔහු කතරගම යන වචනය රහස් සංකේත යොදා ලියා තිබූ ආකාරය වන්නේ මින් කුමක්ද?

1.  2.  3. 

7. වැරදි අදහසක් අඩංගු ප්‍රකාශය තෝරන්න.

I. ත්‍රීවීලරයෙන් මඟින් ප්‍රවාහනය කරයි.එයට රෝද 3කි.
II. බවුසරය ඉන්ධන ගෙන යාමට යොදා ගනී. එයට රෝද 6කි.
III. විල්බැරෝවකින් බර ඇදීම කළ හැක.එයට රෝද 2කි.

8. i. මකුළුවා දැල් ගොතයි.ඌට පාද 8කි.

ii. ඉස්සා ජලයේ ජීවත් වේ. ඌට පාද 10කි.

iii. වවුලා රාත්‍රී කාලයේ සැරිසරයි. ඌ බිත්තර මඟින් බෝ වේ.

9. හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.

1.පරංගියා .................................. ගියා වගේ. ( උඩරට , කෝට්ටේ , පෘතුගාලයේ)

10. ළිඳේ ඉන්න ......................... වගේ. ( මැඩියා, කබරයා , ගෙම්බා )

11. මුලින් සඳහන් දෙදෙනා අතර ඇති සම්බන්ධතාවය හඳුනා ගෙන තුන්වෙනුවට සඳහන් පුද්ගලයා සමඟ එවැනි සම්බන්ධතාවයක් ඇති පුද්ගලයා තෝරා යටින් ඉරක් අඳින්න.

I. නැන්දා , මාමා ⟶ පුංචි අම්මා , ............. ( අයියා , බාප්පා , මහප්පා )

12. ගුරුවරයා, ශිෂ්‍යයා ⟶ වෛද්‍යවරයා, (හෙදිය, රෝගියා, උපස්ථායකයා)

13. ගඟට පාරුව නම්, මුහුදට

I. නැව  II. වැලි  III. රළ

14. බැලුම් බෝල නම්, මිරිස්

I. ගෝනි  ii. කුඩු  iii. කරල්

15. පහත දැක්වෙන වාක්‍ය හෝ කවි පද අර්ථවත් අදහසක් ලැබෙන පරිදි නිවැරදි අර්ථ යොදා සකසා ඇති පිළිතුර වන්නේ,

1. අපේ ගෙදර ගේට්ටුවට
2. බෙන්තර මාමා
3. තට්ටු කරලා බැලුවා
4. බේරුවලින් ආවා

i. 1, 3, 4, 2 ii. 2, 4, 1, 3 iii. 2, 4, 3, 1

16. 1.ළමයින් හැමෝම නැගිට්ටා


2.ආයුබෝවන් ගුරුතුමී

3.සීනුව නාද විය

4.ගුරුතුමිය පන්තියට ආවා


i. 3, 4, 1, 2 ii. 2, 3, 1,2 iii. 1, 3, 4, 2

17. පහත ප්‍රශ්නවලට දී ඇති රූප නිරීක්ෂණය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීයද?

I. 6
II. 8
III. 10



18. මෙම රූපයේ ඇති සමචතුරස්‍ර ගණන කීයද?

I. 8
II. 7
III. 9

19. පහත සඳහන් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය රවුම් කරන්න. පූසා ගෘහ ආශ්‍රිත සතෙකි. ඌ සිවුපාවෙකි. එබැවින් සියලුම සිවුපාවුන් ගෘහ ආශ්‍රිත සතුන් වේ.

I. හරි
II. වැරදි
III. කිව නොහැක

20. අමාවක දිනයක් වූ පසුගිය බදාදා රාත්‍රියේ සඳ එළියෙන් අපි පන්සල් ගියෙමු.

I. හරි
II. වැරදි
III. කිව නොහැක

21. ළමයි පේළියක් සිටගෙන සිටිති. එහි නිමල් සිටින්නේ හරි මැදින් ය. ළමයින් පේළියේ සිටින ළමයින් ගණන විය හැක්කේ?

I. 10 II. 12 III. 11

22.

රු.60.00
ඇපල් ගෙඩියක මිල කීයද?
i. රු.6.00 ii. රු. 10.00 iii. රු.15.00

23. ඇපල් ගෙඩි 2ක් ගන්නා මිලට දොඩම් ගෙඩියක් මිලදී ගත හැක. දොඩම් ගෙඩියක මිල කීයද?

i.රු. 30.00 ii.රු. 20.00 iii.රු. 45.00

24. ඇපල් ගෙඩියක් සහ දොඩම් ගෙඩියක මිල වන්නේ,

i.රු. 45.00 ii.රු. 60.00 iiiරු. 55.00

25.ඇපල් ගෙඩියක් සහ දොඩම් ගෙඩියක් මිලදී ගත් අයකු රු. 100.00 නෝට්ටුවක් දුන්නේ නම් ඔහුට ලැබෙන ඉතිරි මුදල කීයද?

i.රු.50.00 ii.රු.40.00 iii.රු.55.00

26.මගේ ළඟ ඇති මුදලට වඩා රු.20.00 ක් අඩුවෙන් අයියා ළඟ ඇත. අයියා ළඟ රු.27.00ක් ඇත්නම් මගේ ළඟ ඇති මුදල කීයද?

i.රු.47.00 ii.රු.37.00 iii.රු.57.00

හිස් තැනට සුදුසු සංඛ්‍යාව තිත් ඉරි මත ලියන්න.

27. 1, 2, 4, 8,..........................

28. 1, 3, 5, 7,............................

29. 60,50,40,..........,20,

30. රටාව හඳුනාගෙන හිස්තැන් පුරවන්න.

31. අනෙක් වචන සමඟ නොගැළපෙන වචනයක් ඇති වචන පේළිය තෝරන්න.

I. බත්,රොටී, ආප්ප, පිට්ටු
II. දිවුල් , අන්නාසි, පේර , ලොවි
III. කඩල , මුං, කව්පි , ධාන්‍ය

32. සෑම විටම සත්‍ය වන ප්‍රකාශය තෝරන්න.

I. පාසලක සෑම විටම සිසුන් සිටිති.
II. පයින් යන්නන් ගමන් කරන්නේ පාරේ දකුණු පසිනි
III. ඉර පායන්නේ අහසේ නැගෙනහිර පැත්තෙනි

33. වට්ටියක අමු කෙසෙල් ගෙඩි 114 ක් හා ඉදුණු කෙසෙල් ගෙඩි 322ක් ඇත.එහි ඇති මුළු කෙසෙල් ගෙඩි ගණන කීයද?

i.133කි. ii.436කි. iii.246කි.

34.123 සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව පිළිවෙළින් ලියූ විට නිවැරදි පිළිතුර වන්නේ,

i.124, 122 ii.122, 124 iii.123, 125

35.තරඟයකට සහභාගී වූ පිරිමි ළමුන් ගණන 30කි. තරඟයට සහභාගී වූ ගැහැනු ළමයි පිරිමි ළමයි මෙන් දෙගුණයකි. තරඟයට සහභාගී වූ මුළු ළමුන් ගණන වන්නේ,

i.60කි. ii.45කි. iii.90කි.

36.ගොවිපොළක කුකුළෝ 5ක් සහ ගවයින් 13ක් සිටිති. උන්ගේ පාද පාද සංඛ්‍යාව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ ,

i.12, 52 ii.52, 10 ii.10, 52

37.එක්තරා සංඛ්‍යාවක් 5න් ගුණ කර 20ක් එකතු කළ විට උත්තරය 100කි.එම සංඛ්‍යාව කීයද?

i.25 කි ii.16 කි iii.18 කි

38.මට අයියලා දෙදෙනෙක් ද අක්කලා තිදෙනෙක් ද එක් නංගියෙක් ද සිටිති. නංගී පවුලේ කී වෙනියාද?

i. 6 ii.5 iii.7

39.නිමාලිගේ උස සෙ.මී. 110කි. අමාලිගේ උස නිමාලිගේ උසට වඩා සෙ.මී.5 වැඩිය. දෙදෙනාගේම උසේ එකතුව

i. සෙ. මී 225 ii.සෙ.මී. 175 iii.සෙ.මී. 115

40.ජනවාරි 5 දින ආරම්භ කරන වැඩ දින 10කින් අවසන් කළ යුතුය. වැඩය අවසන් කරන දිනය

i.ජනවාරි 15 ii.ජනවාරි 19 iii.ජනවාරි 14

<u>පිළිතුරු පත්‍රය</u>

1. 1
2. 3
3. ii
4. ii
5. 2
6. 1
7. 3
8. iii
9. කෝට්ටේ
10. ගෙම්බා
11. බාප්පා
12. රෝගියා
13. නැව
14. කරල්
15. 2
16. 1
17. 1
18. 3
19. ii
20. ii
21. iii
22. iii
23. i
24. i
25. iii
26. i
27. 16
28. 9
29. 30
30. 20
31. iii
32. iii
33. ii
34. ii
35. iii
36. iii
37. ii
38. iii
39. i
40. iii